| **10** ශ්‍රේණිය | # නර්තනය | සති පාසල |
|---|---|---|

## නර්තන කලාව හා බැඳි ඓතිහාසික පසුබිම

නර්තන කලාවේ ආරම්භය කෙදිනක සිදු වී ඇත් දැයි අපට නිශ්චිත ව ම නිගමනයකට එළඹිය නොහැකි ය. එහෙත් එය මිනිස් සංහතියේ ආරම්භයතෙක් ඈතට දිව යන බව පෙනේ. ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳ විමසීමේ දී එය විවිධ කාල වකවානුවල විවිධ ස්වරූපයෙන් පැවති ඇති බව ඒ පිළිබඳව තොරතුරු අධ්‍යයනය කිරීමේ දී විද්‍යාමාන වේ. මෙම කාල වකවානු යුග වශයෙන් වෙන් කොට දැක්විය හැකිය.

1. ප්‍රාග් බෞද්ධ යුගය
2. අනුරාධපුර යුගය
3. පොළොන්නරු යුගය
4. දුඹදෙණි යුගය
5. කුරුණෑගල යුගය
6. ගම්පොල යුගය
7. කෝට්ටේ යුගය
8. මහනුවර යුගය
9. කොළඹ යුගය

වංශකත, පුරාවිද්‍යාමක සාධක, ශිලා ලේඛන, විදේශිකයන්ගේ වාර්තා, සාහිත්‍ය කෘති වැනි මුලාශ්‍රය මගින් හා ජනප්‍රවාද හා ජනශ්‍රැති මගින් එකල තිබූ නර්තන කලාව පිළිබඳ බොහෝ තොරතුරු අපට සැපයේ.

විදේශිකයන්ගේ ඓතිහාසික වාර්තා

විවිධ යුගයන්හි දී ශ්‍රී ලංකාවට පැමිණි විදේශිය සංචාරකයන් අතරින් ඉබන් බතූනා, රොබට් නොක්ස්, ස්පිල් බර්ජන්, ෆාහියන් යන ගත්කරුවන් ඔවුන්ගේ කෘති මගින් නර්තන කලාව පිළිබඳ තොරතුරු අනාවරණය කොට ඇත.



ඉබන් බතූනාගේ වාර්තාව

14 වන සියවසේදී පමණ එනම් ගම්පොල යුගයේදී ශ්‍රී ලංකාවට පැමිණි ඉබන් බතූතා නැමති සංචාරකයාගේ වාර්තාවේ සඳහන් වන්නේ දෙවුදර උපුල්වන් දේවාලයේ මිනිස් ප්‍රමාණ උස දෙව්රුවක් අබියස 500ක් පමණ හින්දු බාලිකාවන් ගී ගයා නැටූ බවයි. (විදේශීන් දුටු පුරාණ ලංකාව) මෙහි සඳහන් ආකාරයට හින්දු බාලිකාවන් නටන ලද්දේ දෙව්රුව ඉදිරියෙහිය. මේ කරුණු මගින් පැහිදිල වන්නේ එම යුගයේ නර්තන කලාවට භාරතීය ආභාෂය ද ලැබී ඇති බවයි.




ස්පිල් බර්ජන්ගේ වාර්තාව

මහනුවර් යුගයේ (ක්.ව. 1592/1604) විමලධර්ම සූරිය රජ සමයේ ලංකාවට පැමිණි ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් මහනුවර පෙරහැරේ නැටුම් පිළිබඳ මෙසේ ලියා ඇත. "මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත් ඔවුන්ගේ උඩු කය නග්න වූ අතර යටි කයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේය."

 

නොබට් නොක්ස්ගේ වාර්තාව

මහනුවර යුගයේ දෙවන රාජ සිංහ රජ සමයේ (ක්‍රි.ව. 1636 - 1686) ලංකාවට පැමිණි වසර 18 පමණ ලංකායේ සිරකරුයෙකු ලෙස සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් එදා හෙල දිව නම් තම ග්‍රන්ථයේ ඇසල පෙරහැර පිළිබඳවත් එහි තේවාව පිළිබඳව මෙසේ සඳහන් කර ඇත. " එහි දේවාල විහාර වල තේවාව සඳහා නියම වූ කුල වලින් පැමිණ කලගෙඩි සෙල්ලමේ යෙදෙන නලගනෝ වෙත්. ඔවුන් හට නියමු වූ විවිධ ක්‍රීඩා කරමින් තුන්දෙනා බැගින් අතිනත ගෙන රගන ස්ත්‍රීහු වෙති."

ඉහත සඳහන් තොරතුරු අධ්‍යනය කර අවසානයේ පහත සඳහන් දළ සටහන් සම්පූර්ණ කරන්න.

| දේශාටන වාර්තා | විදේශ සංචාරකයන් නම් | නර්තනය භාවිත කළ අයුරු |
|---|---|---|
| විදේශීන් දුටු පුරාණ ලංකාව | | |
| වාර්තාව | | |
| එදා හෙල දිව | | |